# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 158/10 — 1975 අප්‍රේල් 11 වැනි සිකුරාදා — 1975.04.11

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය—සාමාන්‍ය

## මිල පාලන දැන්වීම්

කේ්. ඩී. 157 දරණ ආහාර මිළ නියෝගය — තිරිඟු පිටි

**මිළ පාලන පනත**

**නියෝගය**

(173වන අධිකාරය) වන මිළ පාලන පනතේ 4වන වගන්තිය සමග කියැවෙන 3(2) වගන්තියෙන් මා වෙත පැවරෙන බලතල අනුව මහනුවර දිස්ත්‍රික්කයේ සහ නුවරඑළිය දිස්ත්‍රික්කයේ උඩහේවාහැට ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ සහකාර මිළ පාලක (ආහාර) තැන්පත් අභංගම වලවේගේ චන්ද්‍රසිරි ආරියදස වන මම, මෙම නියෝගය මගින් පහත සඳහන් නියමයන් කරමි :—

(1) අංක 151/66 සහ 1975 පෙබරවාරි මස 19 වෙනි දින දරණ ශ්‍රී ලංකා ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පල කරන ලද අංක කේඩී/156 සහ 1975 පෙබරවාරි මස 19 වෙනි දින දරණ ආහාර මිළ නියෝගය වහාම බලපැවැත්වෙන පරිදි මෙයින් අවලංගු කරමි.

(2) තවද, මීට යාකොට ඇති පළමුවෙනි උපලේඛනයේ පළමුවැනි තීරයේ සඳහන් පෙදෙස් තුළ තිරිඟු පිටි තොග වශයෙන් විකිණීමේදී ශුද්ධ බරෙන් රාත්තල් 112ක් විකිණිය හැකි වැඩිම මිළ එම උප්ලේඛනයේ 2 වෙනි තීරයේ අනුපිළිවෙලින් සඳහන් කර තිබෙන මිළ ගණන් බව වහාම බලපැවැත්වෙන පරිදි මෙයින් නියෝග කරමි.

(3) තවද, මීට යාකොට ඇති දෙවෙනි උපලේඛනයෙහි සඳහන් පෙදෙස් තුළ තිරිඟු පිටි සිල්ලර වශයෙන් විකිණීමේදී ශුද්ධ බර රාත්තලක් විකිණිය හැකි වැඩිම මිළ එම උපලේඛනයේ දෙවැනි තීරයේ අනුපිළිවෙලින් සඳහන් කර තිබෙන මිළ ගණන් බව වහාම බලපැවැත්වෙන පරිදි මෙම නියෝගයෙන් නියම කරමි.

(4) තවද, මෙම නියෝගයේ කාර්‍ය්‍යයන් සඳහා—

(අ) තිරිඟු පිටි ඕනෑම ප්‍රමාණයක් නැවත විකිණීම සඳහා විකිණීමද, ශුද්ධ බර හොණ්ඩරයක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් එකවර විකිණීමද තොග වෙළඳාමක් ලෙස සළකනු ලැබේ.

(ආ) තිරිඟු පිටි ශුද්ධ බරින් හොණ්ඩරයකට වඩා අඩු ප්‍රමාණයක් විකිණීම සිල්ලර වෙළඳාමක් ලෙස සළකනු ලැබේ.

(ඇ) ඉරිඟු මිශ්‍ර තිරිඟු පිටිද, තිරිඟු පිටි වශයෙන් සළකනු ලැබේ.

(5) එසේම මෙම මිළ නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලැබූ කිසියම් ප්‍රදේශයක තිරිඟු පිටි ඉරිඟු පිටි සමග හැර වෙනයම් කිසි ද්‍රව්‍යයක් සමග මිශ්‍ර කොට නොවිකිණිය යුතු බව මෙයින් නියම කරමි.

(6) එසේම කිසිවකු විසින් තිරිඟු පිටි ප්‍රමාණයෙන් සියයට 10කට වඩා ඉරිඟු පිටි සමග මිශ්‍රකර නොවිකිණිය යුතු බව මෙයින් නියම කරමි.

(7) තවද, මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම; යම් ස්ථානයක හෝ යම් වාහනයක තිරිඟු පිටි සිය ස්වාමිත්වයේ හෝ තමාගේ පාලනය යටතේ තබාගෙන සිටින සෑම වෙළෙන්දෙක්ම එම තිරිඟු පිටිවලින් ප්‍රමාණයක් සුදුසු භාජනයක දමා ඒ පිටිවලට මෙම නියෝගයෙන් නියමිත වැඩිම මිළ උසින් අඟලකට අඩු නොවූ ඉලක්කම්වලින් මිළ පුවරුවක ලියා, එම පුවරුව භාජනයක ඇද, එම පිටිද, මිළ පුවරුවද, ඕනෑම ගනුදෙනුකරුවෙකුට පැහැදිලිව පෙනෙන සේ එකී ස්ථානයේ හෝ වාහනයේ තැබිය යුතු බව නියෝග කරමි.

(8) එසේම මෙම නියෝගයේ කාර්‍ය්‍ය සඳහා " රාත්තල " හෝ " රා " යන්නෙන් සළකනු ලබන්නේ ඇවර්දුපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර බවද මෙයින් නියම කරමි.

(9) එසේම මෙම නියෝගයේ කාර්‍ය්‍ය ශුද්ධ බර රාත්තල් 112කට අඩුවෙන් හෝ වැඩි ප්‍රමාණයක තිරිඟු පිටි තොග වශයෙන් විකුණන්නේ නම් ඒ සඳහා නියමිත මිළ මෙම නියෝගයෙන් නියමිත රාත්තල් 112 ක් සඳහා වූ තොග මිළෙන් සමානාත්මකව ගණන් ගත යුතුය.

(10) තවද, මෙම නියෝගයෙන් වැඩිම මිළ නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම තොග වශයෙන් තිරිඟු පිටි විකුණන සෑම තැනැත්තකු විසින් සෑම අවස්ථාවකම හා සිල්ලර වශයෙන් තිරිඟු පිටි විකුණන සෑම තැනැත්තකු විසින් මිළයට ගන්නා ඉල්ලුවහොත් පහත සඳහන් විස්තර එනම් :—

(අ) විකුණූ දිනය ;

(ආ) තිරිඟු පිටි විකුණූ ප්‍රමාණය (බර අනුවයි) ;

(ඇ) තිරිඟු පිටි විකුණූ ප්‍රමාණය සඳහා ගෙවූ මුදල ;

(ඈ) වෙළඳාමේ ස්වභාවය, එනම් වෙළඳාම තොග වශයෙන්ද, සිල්ලර වශයෙන්ද යන වග ඇතුළත් කුවිතාන්සියක් මිළයට ගන්නාට දිය යුතු බවද මෙයින් නියම කරමි.

(11) කිරිඟු පිටි විකිණීමේදී එය යම්කිසි දෙයක බහාලනු ලැබුවේ නම් හෝ ඔතනු ලැබුවේ නම් එහි මිළත් මෙම නියෝගයෙන් නියමිත මිළ ගණන්වලට ඇතුළත් වන බව මෙයින් නියම කරමි.

1975 අප්‍රේල් 09 වෙනි දින පූ.භා. 9ට මහනුවර කච්චේරියේදී අත්සන් කරන ලදී.

ඒ. ඩබ්ලිව්. සී. ආරියදස,
මහනුවර දිස්ත්‍රික්කයේ සහ නුවරඑළිය දිස්ත්‍රික්කයේ
උඩහේවාහැට ප්‍රාදේශීය ආදයම් නිලධාරි කොට්ඨාශයේ
සහකාර මිළ පාලක (ආහාර).

## පළමුවැනිඋප ලේඛනය

| | පළමුවෙනි තීරය<br>පෙදෙස | දෙවැනි තීරය<br>කිරිඟු පිටි ශුද්ධ බර රා. 112ක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ<br>රු. ශ. |
|---|---|---|
| 1. | මහනුවර නාගරික ප්‍රදේශය ... ... ... ... ... ... | 123 03 |
| 2. | උඩුනුවර ප්‍රා. ආ. නි. කොටස— | |
| | ගෙලිඔය ... ... ... ... ... ... | 122 95 |
| | දවලගල ... ... ... ... ... ... | 122 95 |
| | වට්ටප්පොල ... ... ... ... ... ... | 122 95 |
| 3. | යටිනුවර ප්‍රාදේශීය උප දිසාපති කොටස— | |
| | කඩුගන්නාව ... ... ... ... ... ... | 122 91 |
| | පිළිමතලාව ... ... ... ... ... ... | 122 91 |
| 4. | පහත හේවාහැට ප්‍රාදේශීය උප දිසාපති කොටස— | |
| | තලාතුඔය ... ... ... ... ... ... | 123 21 |
| | මාරස්සන ... ... ... ... ... ... | 123 21 |
| | දෙල්තොට ... ... ... ... ... ... | 123 36 |
| 5. | පාතදුම්බර ප්‍රා. ආ. නි. කොටස— | |
| | නවයාලතැන්න ... ... ... ... ... ... | 123 04 |
| | වත්තේගම ... ... ... ... ... ... | 123 04 |
| | කුන්ඩසාලේ ... ... ... ... ... ... | 123 04 |
| 6. | මැදදුම්බර ප්‍රා. ආ. නි. කොටස— | |
| | තෙල්දෙනිය ... ... ... ... ... ... | 123 15 |
| | උඩිස්පත්තුව ... ... ... ... ... ... | 123 15 |
| 7. | උඩදුම්බර ප්‍රා. ආ. නි. කොටස— | |
| | මාඩුගොඩ ... ... ... ... ... ... | 123 38 |
| 8. | මිනිපේ ප්‍රා. ආ. නි. කොටස— | |
| | හසලක ... ... ... ... ... ... | 123 66 |
| | මොරයාය ... ... ... ... ... ... | 123 66 |
| 9. | හාරිස්පත්තුව ප්‍රා. ආ. නි. කොටස— | |
| | අලවතුගොඩ ... ... ... ... ... ... | 123 13 |
| | කිත්තපප්ජල ... ... ... ... ... ... | 123 09 |
| | පූජාපිටිය ... ... ... ... ... ... | 123 04 |
| | හැදෙනිය ... ... ... ... ... ... | 123 09 |
| 10. | තුම්පනේ ප්‍රා. ආ. නි. කොටස— | |
| | ගලගෙදර ... ... ... ... ... ... | 123 29 |
| | හතරලියද්ද ... ... ... ... ... ... | 123 29 |
| 11. | උඩපළාත ප්‍රා. ආ. නි. කොටස— | |
| | ගම්පොල ... ... ... ... ... ... | 123 04 |
| | නාරන්විට ... ... ... ... ... ... | 123 04 |
| | දූල්පිටිය ... ... ... ... ... ... | 123 04 |
| 12. | පස්බාගෙ කෝරළේ ප්‍රා. ආ. නි. කොටස— | |
| | නාවලපිටිය ... ... ... ... ... ... | 123 04 |
| 13. | අඹගමු කෝරළේ ප්‍රා. ආ. නි. කොටස— | |
| | හැටන් ... ... ... ... ... ... | 123 04 |
| | මස්කෙළිය ... ... ... ... ... ... | 123 25 |
| | කෙහෙල්ගමුව ... ... ... ... ... ... | 123 13 |
| 14. | නුවරඑළිය දිස්ත්‍රික්කයේ උඩහේවහැට ප්‍රා. ආ. නි. කොට්ස— | |
| | හඟුරන්කෙත ... ... ... ... ... ... | 123 32 |
| | රිකිල්ලගස්කඩ ... ... ... ... ... ... | 123 32 |
| | පදියපැලැල්ල ... ... ... ... ... ... | 123 43 |
| 15. | ගඟ ඉහළ කෝරළේ ප්‍රා. ආ. නි. කොට්ස— | |
| | කුරුඳුවත්ත ... ... ... ... ... ... | 123 04 |
| | උලපනේ ... ... ... ... ... ... | 123 04 |

## දෙවැනි උපලේඛනය

| පළමුවැනි තීරය<br>පෙදෙස | දෙවැනි තීරය<br>කිරිඟු පිටි සිල්ලර වශයෙන් විකිණිය හැකි ශුද්ධ බර රාත්තලක වැඩිම මිල<br>රු. ශ. |
|---|---|
| 1. (අ) මහනුවර නාගරික ප්‍රදේශය<br>(ආ) ගඟබඩ කෝරළය<br>(ඇ) උඩුනුවර ප්‍රා. ආ. නි. කොටස<br>(ඈ) යටිනුවර ප්‍රා. උ. දිසාපති කොටස<br>(ඉ) දෙල්තොට, පට්ටියගම, උඩගම, පට්ටියගම-පල්ලේගම, ගබඩාගම, නවනැලිය, බෝපිටිය, ගුරුදෙනිය, පුලියද්ද මයිලපිටිය, මාරස්සන, උඩුවෙල-පල්ලේගම සහ උඩුවෙල-උඩගම යන ග්‍රාමසේවක කොට්ඨාශ හැර පාතහේවාහැට ප්‍රා. උ. දිසාපති කොටසේ අනිකුත් සියලුම ප්‍රදේශ<br>(ඊ) පාතදුම්බර ප්‍රාදේශීය ආදයම් නිලධාරි කොට්ඨාශය<br>(උ) මැදදුම්බර ප්‍රාදේශීය ආදයම් නිලධාරිතැනගේ කොට්ඨාශය<br>(ඌ) හාරිස්පත්තුව ප්‍රා. ආ. නි. තැනගේ කොට්ඨාශය<br>(එ) උඩපළාත ප්‍රා. ආ. නි. තැනගේ කොට්ඨාශය<br>(ඒ) පස්බාගේ කෝරළේ ප්‍රා. ආ. නි. කොට්ඨාශය<br>(ඔ) ගඟ ඉහළ කෝරළේ ප්‍රා. ආ. නි. කොට්ඨාශය | 1 12 |
| 2. (අ) දෙල්තොට-පට්ටියගම, උඩගම,, පට්ටියගම-පල්ලේගම, ගබඩාගම, නවනැලිය, බෝපිටිය, ගුරුදෙනිය, පුලියද්ද, මයිලපිටිය, මාරස්සන, උඩුවෙල-පල්ලේගම සහ උඩුවෙල-උඩගම යන පාතහේවාහැට ප්‍රා. උ. දිසාපති තැනගේ ග්‍රාමසේවක කොට්ඨාශ<br>(ආ) කුම්පනේ ප්‍රා. ආ. නි. තැනගේ කොට්ඨාශය<br>(ඇ) උඩත්තව සහ මීමුරේ යන ග්‍රාමසේවක කොට්ඨාශ හැර උඩදුම්බර ප්‍රා. ආ. නි. තැනගේ කොට්ඨාශයේ අනිකුත් සියලුම ගම් ප්‍රදේශ<br>(ඈ) පොල්පිටිය ග්‍රාමසේවක කොට්ඨාශය හැර අඹගමුව කෝරළයේ ප්‍රා. ආ. නි. කොට්ඨාශයේ අනිකුත් ප්‍රදේශ<br>(ඉ) ඉඩම්පිටිය ග්‍රාමසේවක කොට්ඨාශය හැර නුවරඑළිය දිස්ත්‍රික්කයේ උඩහේවාහැට ප්‍රා. ආ. නි. කොට්ඨාශයේ අනිකුත් සියලුම ප්‍රදේශ | 1 12 |
| 3. අඹගමුව කෝරළයේ ප්‍රා. ආ. නි. කොට්ඨාශයේ පොල්පිටිය ග්‍රාමසේවක කොට්ඨාශය ... ... ... | 1 14 |
| 4. (අ) උඩත්තව හා මීමුරේ යන උඩදුම්බර ප්‍රා. ආ. නි. කොට්ඨාශයේ ග්‍රාමසේවක කොට්ඨාශ<br>(ආ) ඉඩම්පිටිය යන නුවරඑළිය දිස්ත්‍රික්කයේ උඩහේවාහැට ප්‍රා. ආ. නි. කොට්ඨාශයේ ග්‍රාමසේවක කොට්ඨාශ<br>(ඇ) මිනිපේ ප්‍රා. ආ. නි. කොටස | 1 14 |

**සැළකිය යුතුයි.**—මෙම මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණීමේ නියම මිළ නොවේ. මේවා ඒ ද්‍රව්‍ය විකිණිය හැකි වැඩිම මිළ වේ. මෙ මිළ ගණන් වලට ඉහළින් ඒ ද්‍රව්‍ය විකිණිය නොහැක.

4–406

---

අංක වී 125 දරණ ආහාර මිළ නියෝගය — කිරිඟු පිටි

### මිළ පාලන පනත (173 පරිච්ඡෙදය)

වවුනියා දිසාවේ සහකාර මිළ (ආහාර) පාලක තැන්පත් කන්දයියා සිවප්‍රකාශම් වන මම, මිළ පාලන පනතේ (173 පරිච්ඡෙදය) 3 (2) දරණ වගන්තිය සමග කියවිය යුතු 4 වන වගන්තිය යටතේ මට පැවරී ඇති බලතල අනුව—

(1) 1975 පෙබරවාරි මස 19 වන දින අංක 151/66 දරණ ශ්‍රී ලංකා ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ පල කරන ලද, 1975 පෙබරවාරි මස 17 වන දින වී. 124 දරණ ආහාර මිළ නියෝගය 1975 මාර්තු මස 31 වන දින සිට ක්‍රියාත්මක වනපරිදි මෙම නියෝගයෙන් අවලංගු කරමි.

(2) තවද, මීට යාකර ඇති උපලේඛනයේ පළමුවන තීරයේ සඳහන් ප්‍රදේශයන් තුළ, කිරිඟු පිටි තොග වෙළෙන්දෙකු විසින් තොග වශයෙන් විකිණීමේදී හා සිල්ලර වෙළෙන්දෙකු විසින් පාරිභෝගිකයෙකුට සිල්ලර වශයෙන් විකිණීමේදී, එම උපලේඛනයේ අනුපිළිවෙලින් 2 වන හා 3 වන තීරවල දක්වා ඇති වැඩිම මිළ ගණන් බව 1975 මාර්තු මස 31 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි මෙම නියෝගයෙන් නියම කරමි.

(3) තවද, මෙම නියෝගයෙහි කාය්‍යීය සඳහා—

(අ) කිරිඟු පිටි ඕනෑම ප්‍රමාණයක් නැවත විකිණීම සඳහා විකිණීමක් හෝ කිරිඟු පිටි වරකට ශුද්ධ බර හොණ්ඩරයක (රා. 112) ප්‍රමාණයක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් විකිණීම තොග වශයෙන් විකිණීමක් වශයෙන් සලකන බවත් ;

(ආ) පාරිභෝගය හෝ පාවිච්චිය පිණිස කිරිඟු පිටි ශුද්ධ බර හොණ්ඩරයකට (රා. 112) අඩු ඕනෑම ප්‍රමාණයක් විකිණීම සිල්ලර වශයෙන් විකිණීමක් ලෙස සලකනු ලබන බවත් ;

මෙම නියෝගයෙන් නියම කරමි.

(4) එසේම, මෙම නියෝගයේ වැඩිම මිළ ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම, කිරිඟු පිටි මෙම ද්‍රව්‍යයන් සමග මිශ්‍ර කිරීමෙන් බාල කොට කිසිවකු විසින් නොවිකිණිය යුතු බව නියම කරමි.

(5) තවද, මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම, යම් ස්ථානයක හෝ යම් වාහනයක හෝ කිරිඟු පිටි සිය ස්වාමිත්වය යටතේ හෝ පාලනය යටතේ හෝ තබාගෙන සිටින සෑම වෙළෙන්දෙකුම එම ද්‍රව්‍යයෙන් ප්‍රමාණයක් සුදුසු භාජනයක දමා එම ද්‍රව්‍යය සඳහා මෙ නියෝගයේ වැඩිම මිළ උසින් අඟලකට වඩා අඩු නොවූ ඉලක්කම්වලින් මිළ පුවරුවක සටහන් කොට, එම භාජනයට සම්බන්ධ කොට එකී ද්‍රව්‍යය හා නියමිත වැඩිම මිළ ඕනෑම ගනුදෙනුකාරයකුට පෙනෙන සේ එකී ස්ථානයේ හෝ වාහනයේ තැබිය යුතු බව නියම කරමි.

(6) එසේම, මෙම නියෝගයෙහි කාය්‍යීය සඳහා " රාත්තල " හෙවත් " රා. " යන්නෙන් සලකනු ලබන්නේ ඇවර්දුපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර බවද නියම කරමි.

(7) තවද, මෙම නියෝගයෙන් වැඩිම මිළ නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම තිරිඟු පිටි තොග වශයෙන් විකුණන සෑම තැනැත්තෙකු හා තිරිඟු පිටි සිල්ලර වශයෙන් විකුණන සෑම තැනැත්තෙකු විසින්ම මිළයට ගන්නා ඉල්ලුවහොත් පහත සඳහන් විස්තර, එනම් :—

(අ) විකුණූ දිනය ;

(ආ) එම ද්‍රව්‍යයෙන් විකුණූ ප්‍රමාණය (බර අනුව) ;

(ඇ) විකුණූ ප්‍රමාණය සඳහා ගෙවූ මුදල ;

(ඈ) වෙළඳාමේ ස්වභාවය

එනම් වෙළඳාම තොග වශයෙන්ද, සිල්ලර වශයෙන්ද යන වග ඇතුළත් කුවිතාන්සියක් මිළයට ගන්නාට දිය යුතු බවද නියම කරමි.

(8) තිරිඟු පිටි විකුණන විට ඒ විකුණනු ලබන ද්‍රව්‍යය යම්කිසි දෙයක ඔතනු ලැබේ නම් හෝ බහාලනු ලැබේ නම් හෝ එහි මිළත් උපලේඛනයේ 2 වන හා 3 වන තීරවල සඳහන් වැඩිම මිළ ගණන්වලට ඇතුළත් වන බවද, නියම කරමි.

1975 අප්‍රේල් මස 4 වන දින පෙ.ව. 9.00 ට වවුනියා දිසාපති කාර්යාලයේදී අත්සන් කරන ලදී.

කේ. සිවප්‍රකාශම්,
සහකාර මිළ (ආහාර) පාලක, වවුනියා දිස්ත්‍රික්කය.

උපලේඛනය

| පළමුවන තීරය | | දෙවන තීරය | තුන්වන තීරය |
|---|---|---|---|
| අංක | ප්‍රදේශය | ශුද්ධ බර හොණ්ඩරයක් (රා. 112) තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ | ශුද්ධ බර රාත්තල් එකක් සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ |
| | | රු. ශ. | රු. ශ. |
| 1 ... | වවුනියාව දකුණු දෙමළ හා සිංහල ප්‍රා.ආ.නි. කොට්ඨාශයන් තුළ ... | 123 40 ... | 1 12 |
| 2 ... | වෙඩඩිකුලමෙහි, චෙන්ගල වෙඩඩිකුලම් ප්‍රා.ආ.නි. කොට්ඨාශය තුළ ... | 123 83 ... | 1 13 |
| 3 ... | මාන්කුලම්, පුලියන්කුලම්, කනගරායන්කුලම්, යන ගම්මුලාදෑනි කොට්ඨාශයන් හැර වවුනියාව උතුර (නෙඩුන්කේර්නි) ප්‍රා.ආ.නි. කොට්ඨාශය තුළ... ... ... ... | 123 76 ... | 1 13 |
| 4 ... | නෙඩුන්කේර්නි ප්‍රා.ආ.නි. කොට්ඨාශයේ මාන්කුලම්, පුලියන්කුලම්, කනගරායන්කුලම් යන ගම්මුලාදෑනි කොට්ඨාශයන් තුළ ... | 123 83 ... | 1 13 |
| 5 ... | මුහුදුබඩ පත්තු ආදායම් නිලධාරි කොට්ඨාශය හා පුතුකුඩියිරිප්පු ආදායම් නිලධාරි කොට්ඨාශය තුළ ... ... ... | 124 06 ... | 1 13 |

සැලකිය යුතුයි :

(1) මෙම මිළ ගණන් තිරිඟු පිටි විකිණිය යුතු නියමිත මිළ ගණන් නොවේ. මේ එම ද්‍රව්‍යය විකිණිය හැකි ඉතාම වැඩි මිළ ගණන්ය. මෙම මිළ ගණන්වලට ඉහළින් තිරිඟු පිටි විකිණිය නොහැකිය.

(2) තොග වශයෙන් විකුණන තිරිඟු පිටි ශුද්ධ බර හොණ්ඩරයකට (රා. 112) අඩු හෝ වැඩි ඕනෑම ප්‍රමාණයකට ගෙවිය හැකි උපරිම මිළ ඉහත සඳහන් ශුද්ධ බර හොණ්ඩරයක් (රා. 112) තොග වශයෙන් විකිණිය හැකි උපරිම මිළ අනුව සුපුරුදු ලෙස අනුපාතිකව ගණන් බලා සොයාගන්නා වටිනාකමය.

4-407

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී